HAREENDRA R. BANAGALA
Bsc (Mgt) Hrm, Attorney At Law.
No. 529/1, Galle Road,
Rawathawaththa, Moratuwa,
Sri Lanka.

පුජ්‍ය පාහින්ගල ආනන්ද සාගර හිමි
පාහියන්ගල ආරණ්‍ය සේනාසනය
පාහියන්ගල
බුලත්සිංහල
2024.09.04

**<u>එන්තරවාසියයි</u>**

ස්වාමින්වහන්ස,

මාගේ සේවාදායක වංචාවල, පනාගමුව, මලිගස්පේ ගෙදර, පදිංචි මලිගස්පේ කෝරළගේ නලීන් මනුෂ නානායක්කාර මහතාගේ උපදේස් මත ලියා දන්වමි.

උක්ත නම් සදහන් මාගේ සේවාදායක ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තු මන්ත්‍රිවරයෙකු හා ශ්‍රී ලංකා ජනරජයේ විදේශ කටයුතු හා රැකි රක්ෂා ගරු අමාත්‍යවරයා ලෙස කටයුතු කරන ලද බව දන්වා සිටිමි.

එලෙස එකී අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන ලද කාලවකවානුවේදී මාගේ සේවාදයාකයා විසින් ඔහුගේ මස්සිනා වන තැනැත්තෙකුට අයත් රැකියා ඒජන්සියකින් විදේශ රැකියා සදහා තැනැත්තන් පිටත් කර හරිමින් රුපියල් කෝටි ප්‍රකෝටි ගණනින් මුදල් උපයා ඇති බවට වු ප්‍රකාශයක් ඔබ වහන්සේ විසින් ප්‍රකාශ කරන ලදුව එකී අවස්ථාව විඩියෝ දර්ශණ සහිතව වර්ෂ 2024 සැප්තැම්බර් මස 03 වන දින හිරු නාලිකාවේ සන්ධ්‍යා ප්‍රවෘත්ති ප්‍රකාශයේ විකාශනය කර ඇත.

තවද එකී ප්‍රකාශය තුළ ඔබ වහන්සේ විසින් අවස්ථා කීපයකදීම මනුෂ, මනුෂගේ අමාත්‍යංශය යන වචන භාවිතා කර මාගේ සේවාදායක ඉලක්ක කර අදාළ පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කරන අතර මනුෂගේ අමාත්‍යංශය රුපියල් කෝටි ගණනක දේපළ හොරකම් කර ඇති බව ප්‍රකාශ කර ඇත.

මෙරට ඉතිහාසයේ කිසිදු අවස්ථාවක මනුෂ නමින් රැකී රක්ෂා හෝ විදේශ රැකියා විෂයභාරව වෙනත් කිසිදු තැනැත්තෙකු අමාත්‍යවරයා වශයෙන් කටයුතු කර නොමැති අතර ඔබ වහන්සේ විසින් මාගේ සේවාදායක ඉලක්ක කරමින් හා මාගේ සේවාදායක හට අපහාස කිරීමේ අරමුණින් එකී ප්‍රකාශය සිදුකර ඇති බව මාගේ සේවාදායක ප්‍රකාශ කර සිටී.

මෙරට දේශපාලන ක්‍රියාවලිය තුළ කිර්තිමත් පරිචයක් හා දේශපාලනික චපසරියක් පවත්වාගනිමින් සිටින මාගේ සේවාදායක හට එකී ප්‍රකාශය මත බරපතල අපහාසයක් සිදුවී ඇති බවද, කිසිදු අකාරයකින් මාගේ සේවාදායක සම්බන්ධතාවක් හා/හෝ දැනීමක් නොමැති අසත්‍ය හා පදනම් විරහිත චෝදානාවන්ට මාගේ සේවාදායක සම්බන්ධ කරමින් ඔහුට විරුද්ධව මෙම අපහාසාත්මක ප්‍රකාශය සිදුකර ඇති බවද මාගේ සේවාදායකගේ උපදෙස් මත ලියා දන්වමි.

HAREENDRA R. BANAGALA
**Bsc (Mgt) Hrm, Attorney At Law.**

No. 529/1, Galle Road,
Rawathawaththa, Moratuwa,
Sri Lanka.

විශේෂයෙන් එකී ප්‍රකාශය මත මාගේ සේවාදායකයාගේ දේශපාලනික ක්‍රියාවලිය බරපතල අනතුරකට ලක්වන අතර එකී විඩියෝ දර්ශණ මත වු පදනම් විරහිත හා අසත්‍ය කරුණු හේතුවෙන් ඇති වන පෙළඹවීම මත ඔහුගේ ජීවතය පවා අනාරක්ෂිත තත්වයට පත්විය හැකි බව මාගේ සේවාදායකගේ උපදෙස් මත ලියා දන්වමි.

කරුණු එසේ හෙයින් උක්ත කරුණු මත මාගේ සේවාදායකගේ කීර්ති නාමයට සිදුවූ අප්‍රතිකාරී හානිය රුපියල් මිලියන පන්සියක් (රු500,000,000/-) වශයෙන් මාගේ සේවාදායක විසින් සාධාරණව තක්සේරු කර සිටීන අතර එකී රුපියල් මිලියන පන්සියක (රු500,000,000/-) වන්දි මුදල ඔබ වහන්සේගෙන් අයකර ගැනීමට මාගේ සේවාදායක හට කරුණු උද්ගතව ඇත.

ඒ අනුව මෙම දැන්වීම ලැබී දින 14 ක් ඇතුලත ඉහත කී රුපියල් මිලියන පන්සීයක (රු500,000,000/-) මුදල මාගේ සේවාදායක වෙත සම්පූර්ණයෙන්ම ගෙවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටින අතර එසේ කිරීමට ඔබ වහන්සේ අපොහොසත් වුවහොත් ඔබ වහන්සේට එරෙහිව සුදුසු අධිකරණය නිසි නඩුකටයුතු පවරා එකී රුපියල් මිලියන පන්සියක (රු500,000,000/-) වන්දි මුදලත්, ඊට ආනුශංගික අලාභ හා නඩු ගාස්තු අයකර ගැනීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් උපදේ ලැබී ඇති බව දන්වා සිටිමි.

මීට වීශ්වාසී
නිතිඥ

HAREENDRA R. BANAGALA
Bsc(Mgt)(HRM)
Attorney-at-Law
Commissioner for Oaths
No. 529/1, Galle Road,
Rawatawatte, Moratuwa
Tel 0777 598 448